# ඩ්‍රැගන් පෲට් (Dragon Fruit)



**(*Hylocereusundatus*)**

ඩ්‍රැගන් පෲට් (Hylocereusundatus) කැක්ටේසියේ (Cactaceae) කුලයට අයත් අපිශාක ලෙස වැඩෙන බහු වාර්ෂික ශාකයකි. මධ්‍යම හා දකුණු ඇමෙරිකාවේ සම්භවය වූ ලෙස සැලකෙන මෙම ශාකය එහිදී පීතාය (Pitaya) යන නමින් හඳුන්වනු ලැබේ. මෑත භාගයේ සිට සීඝ්‍රයෙන් ප්‍රචලිතවන කැක්ටේසියේ කුලයේ සාමාජිකයා වන මෙම ඩ්‍රැගන් පෲට් ශාකය දැනට වියට්නාමය, තායිලන්තය, මැලේසියාව, ඊශ්‍රායලය ආදී රටවල් රාශියක ආර්ථික බෝගයක් ලෙස වගා කෙරේ.

ඩ්‍රැගන් පෲට් ශාකය ලංකාවේද ජනප්‍රිය වෙමින් පවතින අතර පහතරට තෙත් කලාපයේත්, අතරමැදි කලාපයේත් අතිරේක ජල සම්පාදනය යටතේ වියලි කලාපයේත් සාර්ථකව වගාකල හැක. මෙම වගාව දියුණු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දැනට පර්යේෂණ කටයුතු කෙරීගෙන යයි.

## ප්‍රයෝජන

ඩ්‍රැගන් පෲට් පලතුරු ශාකයක් මෙන්ම විසිතුරු ශාකයක් ලෙසද ජනප්‍රියය. ඵලය ඉදුණුවිට කෙලින්ම ආහාරයට ගත හැකිය. එසේම මෙය ජෑම්, අයිස්ක්‍රීම්, ජෙලි, පලතුරු යුෂ හා වයින් වැනි අතුරු නිෂ්පාදන සෑදීමටද යොදාගතු ලැබේ. මීට අමතරව ඩ්‍රැගන් පෲට් මල පිපීමට පෙර පොහොට්ටු අවස්ථාවේ ව්‍යාංජනයක් ලෙස සකස්කර ආහාරයට ගත හැක.

මෙම පලතුර ආහාරයට ගැනීමෙන් ආහාර දිරවීමේ හැකියාව වැඩිකෙරේ. එසේම මෙයට පිළිකා මර්ධනය කිරීම හා දියවැඩියාව, රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය හා රුධිර පීඩනය පාලනය කිරීමේ ඖෂධීය ගුණයක් ඇති බව සඳහන් වේ.

### පෝෂණ ගුණය

ඩ්‍රැගන් පෲට් ඉදුණු ඵලයේ ආහාරයට ගත හැකි කොටස් ග්‍රෑම් 100 ක අඩංගු ද්‍රව්‍ය

| | | |
|---|---|---|
| ජලය ග්‍රෑම් | 82.5 | - 83 |
| ප්‍රෝටීන් ග්‍රෑම් | 0.159 | - 0.229 |
| මේදය ග්‍රෑම් | 0.21 | - 0.61 |
| දළතන්තු ග්‍රෑම් | 0.7 | - 0.9 |
| කැරොටින් මිලි.ග්‍රෑම් | 0.005 | - 0.012 |
| කැල්සියම් මිලි.ග්‍රෑම් | 6.3 | - 8.8 |
| පොස්පරස් මිලි.ග්‍රෑම් | 30.2 | - 36.1 |
| යකඩ මිලි.ග්‍රෑම් | 0.55 | - 0.65 |
| විටමින් B 1 මිලි.ග්‍රෑම් | 0.28 | - 0.043 |
| විටමින් B 2 මිලි.ග්‍රෑම් | 0.043 | - 0.045 |
| විටමින් B 3 මිලි.ග්‍රෑම් | 0.297 | - 0.43 |
| විටමින් C මිලි.ග්‍රෑම් | 8.0 | - 9.0 |
| තයමින් මිලි.ග්‍රෑම් | 0.28 | - 0.30 |
| රයිබොප්ලේවින් මිලි.ග්‍රෑම් | 0.043 | - 0.044 |
| නයසින් මිලි.ග්‍රෑම් | 1.297 | - 1.30 |
| අළු ග්‍රෑම් | 0.28 | - |
| වෙනත් ග්‍රෑම් | 0.54 | - 0.68 |

මෙහි ඉදුනු ඵලයේ මාංශලය විටමින් වලින් පොහොසත්ය.

**ප්‍රභේද**
කැක්ටේසියේ කුලයේ හයිලොසෙරස් විශේෂ (Hylocereusspp) හා සෙලිනිසෙරස් විශේෂ (Selenicereusspp) වල ප්‍රභේද හා දෙමුහුන් ප්‍රභේද ලෝකයේ විවිධ රටවල ආර්ථික වගා ලෙස විශේෂයෙන් වගා කෙරේ. මේ සියල්ල පොදුවේ ඩ්‍රැගන් ෆෘට් ලෙස සැලකුවද විශේෂයෙන් වගා කෙරේ. මේ සියල්ල පොදුවේ ඩ්‍රැගන් ෆෘට් ලෙස සැලකුවද විශේෂයෙන් ඩ්‍රැගන් ෆෘට් ලෙස සඳහන් වන්නේ හයිලොසෙරස් අන්ඩේටස් (Hylocereusundatus) ය.

**හයිලොසෙරස් අන්ඩේටස්**



මෙය විසිතුරු ශාකයක් ලෙසද ජනප්‍රියය. ඉදුණු ඵලය කිලෝ ග්‍රෑම් 1 ක් හෝ ඊට වැඩිය. ඵලයේ පොත්ත රතුපාටය. මදය සුදු පාට වන අතර විනිවිද පෙනේ. කදේ කටු අඩුය. ඩ්‍රැගන් ෆෘට් (Dragon Fruit), පිතායා (Pitaya) ස්ටෝබෙරි පෙයාස්, (Strawberry Pear) යන නම් වලින්ද සඳහන් වන්නේ මෙම විශේෂයයි.

**හයිලොසෙරස් පොලිරයිසස් (*HylocereusPolyrhizus*)**



මෙහි ඵලයේ බර කිලෝ ග්‍රෑම් 1 පමණ වන අතර එහි පොත්ත රතුපාටය මදය තද රතුපාටය. කදේ කටු වැඩිය.

**සෙලිනිසෙරස් මෙගලින්තස් (*Selenicereusmegalanthus*)**
මෙහි ඉදුණු ඵලයේ පොත්ත කහපාටය. මදය සුදු පාටය. කහ පිතායා (Yellow Pitaya) ලෙස මෙය හඳුන්වයි. ඉහත විශේෂ තුනෙහිම ඵලයේ මදයෙහි විසිරුණු කුඩා කළුපාට ඇට ඇත.

## දේශගුණික අවශ්‍යතා

ඩ්‍රැගන් ෆෘට් පතොක් කුලයේ ශාකයක් නිසා එයට නියගය, දුර්වල පාංශු තත්ව හා අඩු උෂ්ණත්වය දැරීමේ හැකියාවක් ඇත.

නමුත් වගාවට වඩාත් උචිත වන්නේ 20 - 30 $^{o}$Cඋෂ්ණත්වය පවතින වියලි සර්ම කලාපීය දේශගුණයකි. එසේම වර්ෂාපතනය මිලි ලීටර් 500 - 1500 හා පැහැදිලි වියලි හා තෙත් දේශගුණික තත්ව මාරුවෙන් මාරුවට තිබීම වඩා යෝග්‍යය. ශාකයට හොඳින් හිරු එළිය අවශ්‍ය වුවත් අධික උෂ්ණත්වය දිගුකලක් පැවතීම ශාකයට හිතකර නොවන අතර එවැනි අවස්ථාවල සෙවන සැපයීම අවශ්‍ය වේ.

### පස හා ජලය

ඩ්‍රැගන් ෆෘට් වගාව සඳහා හොඳින් ජල වහනය වන පසක් තිබීම අත්‍යවශ්‍යය. එසේම ශාකය කාබනික ද්‍රව්‍ය සඳහා හොඳින් ප්‍රතිචාර දක්වන අතර පසේ වැලි 10 - 30 % පමණ තිබීම ඉතා හොඳය. මෙම ශාකය වැලි සහිත පසේද සාර්ථකව වැවේ.

## රෝපන ද්‍රව්‍ය සකසා ගැනීම

සිටුවීමට අවශ්‍ය පැල පහත ලෙස නිපදවාගත හැක.

1. දඬු කැබලි පැල කිරීමෙන් - සාමාන්‍යයෙන් පැල නිපදවාගන්නේ මෙම ක්‍රමයෙනි.

2. බීජ පැල - බීජ පැල කිරීමෙන්ද පැල නිපදවාගත හැකි වුවද ආර්ථික වගාවන්ට මේවා යොදාගනු නොලැබේ. හේතුව ඵල හටගැනීමට දිගු කාලයක් ගතවීමත් මව් ශාකයේ තිබුණු ලක්ෂණ පැලවල වෙනස් විය හැකි නිසාත්ය.

## දඬු කැබලිවලින් පැල නිපදවා ගැනීම



තෝරාගත් ඵල දරණ මව්ශාකවලින් දඬු ගබාගත යුතුය.

මේවා සෙ.මී. 15 - 20 පමණ දිග කැබලිවලට කපා බඳුන් කිරීමට පෙර දින 1 - 2 පමණ වියලි ස්ථානයක ගබඩාකර තැබිය යුතුය.

ඉන්පසුව මෙම දඬු කැබලි හොඳින් ජලවහනය වන බඳුන් මිශ්‍රණයකින් පිරවූ බඳුන්වල සිටවනු ලැබේ. බඳුන් පිරවීම සඳහා වියලි ගොම : මතුපිට පස් : වැලි : 1 : 1 : 2 මිශ්‍රණයක් යෝග්‍යය. මෙම බඳුන් සාමානය තෙතමන තත්වයේ සෙවනේ තැබීමෙන් දඬු දඬු කැබලිවල මුල් අද්දවා ගනු ලැබේ.

දඬු කැබලිවල අතු රිකිලිද වැඩීමෙන් පසු ඒවා පරිසරයට හුරුකිරීමෙන් අනතුරුව සිටුවීමට යොදාගනී.

## සිටුවීම

මුල් ඇද්දවූ දඬු කැබලි සිටුවීම සඳහා මීටර් 2 x 2 පරතරයට සෙ.මී. 60 x 60 x 60 ප්‍රමාණයට වලවල් කපාගත යුතුය. එම වලවල් මතුපිට පස්, දිරූ ගොම හෝ කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 10 - 15 හා සුපර් පොස්පේට් ග්‍රෑම් 100 සහිත මිශ්‍රණයකින් පුරවා දඬු සිටවනු ලැබේ. පසේ ජල වහනය දුර්වල නම් වළේ පතුලට කුඩා ගඩොල් කැබලි තට්ටු 1 - 2 දමා ඉහත මිශ්‍රණයට අමතරව වැලි ප්‍රමාණයක් ද කලවම්කර වල පුරවාගන්න.

## ගස් පුහුණු කිරීම

මෙම ශාකය අධාරකයක උපකාරයෙන් ඉහලට වැඩෙන නිසා පැලය ආසන්නයේ 5' - 6' උස ලී හෝ කොන්ක්‍රීට් කනුවක් සිටුවිය යුතුය. වැඩෙන කඳ කනුවට ගැට ගසමින් ශාකය ඉහලට වැඩීමට සැලැස්විය යුතුය. කඳේ වැඩෙන වායව මුල් මගින් ශාකය ආධාරකයට තදින් අල්ලා ගැනීම සිදුවේ. ඉහලට වැඩෙන කදෙන් හටගන්නා පාර්ශ්වික කදන් සීමා කලයුතු අතර ප්‍රධාන ප්‍රධාන කදන් 2/3 පමණක් වැඩීමට ඉඩදේ. එනිසා කනුව මත වැඩෙන ප්‍රධාන කදන් වල පහත පාර්ශ්වික කදන් වරින් වර ඉවත් කලයුතුය.

ආධාරකයේ මුදුනේ 2' පමණ අරය ඇති රවුම් කම්බි රාමුවක් සකසා ගතයුතු අතර කනුවට උඩින් වැඩී පහතට එල්ලෙන අතු මේ රවුම මත සමතුලිත පඳුරක් ලැබෙන ලෙස පුහුණුකර ගත යුතුය.

## ලෙඩ රෝග

මෙම බෝගයට රෝග හා පළිබෝධ හානි ඉතා අඩුවීම විශේෂ කරුණකි. නමුත් සමහර රටවලට දිලීර රෝග වාර්තා වී ඇත.

## මල් හටගැනීම



ඩ්‍රැගන් ෆෲට් වල මල රාත්‍රියට පිපෙන අතර එය සුදට හුරු ක්‍රීම් පැහැතිය. පෙනුමෙන් කඩුපුල් මලකට සමාන වන මෙය පිපෙන විට ඇති සුවඳ කෘමීන් ආකර්ශකය කර ගැනීමට හේතුවේ. අප රටේ අතරමැදි කලාපයේ මල් පිපීම අප්‍රේල්/මැයි සිට ආරම්භ වේ.

මලෙහි සුන්දරත්වය නිසා Queen of night, Moon flower, Nobal woman ආදී අන්වර්ථ නාම වලින් එය හඳුන්වනු ලැබේ.

## එල හටගැනීම

ඩ්‍රැගන් ෆෲට් ශකයේ මල් පොහොට්ටු (Buds) හටගෙන දින 40-50 පමණ නැතිනම් මල් පිපී දින 30 - 35 දී එල මේරීම සිදුවේ. එල වාරය නොවැම්බර් පමණ වන තෙක් පවතින අතර ඒ කාලය තුලදී 5 - 6 වතාවක් එල නෙලාගත හැක.

නොමේරූ එලයේ පොත්ත දිලිසෙන සුළු කොළපාට වන අතර එය මේරීමත් සමග රතු පැහැයට හැරේ. මෙම පැහැයට හැරී දින 4 - 5 පමණ එල නෙලීම වඩාත් සුදුසු වුවත් අපනයනය කිරීමේදී රතු පාටට හැරී දිනකට පසු එල නෙලා ගැනීම සුදුසුය. අප රටේ අතරමැදි කලාපයේදී එලයක බර ග්‍රෑම් 300 - 600 පමණ වේ. වසරකට සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකින් කිලෝ ග්‍රෑම් 10,000 පමණ වේ.

## පොහොර යෙදවීම

ඩ්‍රැගන් ෆෘට් වනාශ්‍රිත පතොක් කුලයේ ශාකයක් නිසා කාන්තාර තත්ත්ව යටතේ වැඩෙන පතොක් ශාක වලට වඩා පොහොර හා ජලය යෙදීම අවශ්‍යය. මෙම බෝගය වගා කිරීම සඳහා යොමුවූයේ මෑතකදී නිසා එයට අවශ්‍ය පොහොර තවම නිර්දේශ කර ඇත. නමුත් පහත පොහොර ප්‍රමාණයන් යෙදීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැක.

**කාබනික පොහොර**

ඩ්‍රැගන් ෆෘට් ශාකය වර්ධනයට පසේ හොඳින් කාබනික පොහොර තිබීම වැදගත්ය. එනිසා වසරකට ගසකට යොදන කාබනික පොහොර කිලෝ 15 සිට වසරින් වසර කිලෝ 2 බැගින් වැඩිකර උපරිමය කිලෝ 20 දක්වා වැඩි කිරීම යෝග්‍යය.

**රසායනික පොහොර**

එල නොදරන මුල් කාලයේදී පොහොර යෙදීම. පැල සිටුවා මාසයකට පසු හා සෑම මාස 04 කට වරක් ගසකට පහත මිශ්‍රණය යොදන්න.

- යූරියා - ග්‍රෑම් 72
- සුපර් පොස්පේට් - ග්‍රෑම් 88
- මියුරියේට් ඔෆ් පොටෑෂ් - ග්‍රෑම් 40

**එල දරණ ගස් සඳහා පොහොර**

එල දරණ ගස් සඳහා පොහොර යෙදීමේදී අඩු නයිට්‍රජන් ප්‍රමාණයකුත් වැඩි පොටෑෂ් ප්‍රමාණයකුත් යෙදීම උසස් අස්වැන්නක් ලබාගැනීම වැදගත්ය. මෙම අවස්ථාවේ පොහොර යෙදීමේදී මල් පිපීම ආරම්භ වීමට පෙර (අප්‍රේල්) එල වර්ධනය වන අවධියේ (ජූලි / අගෝස්තු) හා අස්වනු නෙලා අවසානයේ (දෙසැම්බර්) පහත මිශ්‍රණය වරකට ගසකට යොදන්න.

- යූරියා - ග්‍රෑම් 50
- සුපර් පොස්පේට් - ග්‍රෑම් 50
- මියුරියේට් ඔෆ් පොටෑෂ් - ග්‍රෑම් 100

වසරකට ගසකට යොදන මුළු පොහොර ප්‍රමාණය වසරක් පාසා ග්‍රෑම් 225 බැගින් වැඩිකරමින් කිලෝ 1 1/2 ක් උපරිමයක් දක්වා පොහොර වැඩි කරන්න.

## ජල සම්පාදනය

හොඳ අස්වැන්නක් ලබාගැනීමට වියලි කාලයේදී ජලය සම්පාදනය කිරීම අවශ්‍යය. එසේම වියලි කලාපයේ වගා කරන්නේ නම් අතිරේක ජල සම්පාදනය අවශ්‍යය.

## ගබඩා කිරීම

ඩ්‍රැගන් ෆෘට් ඵලය 5 $^{0}$Cහා 90% HR යටතේ දින 40 පමණ ගබඩාකර තැබිය හැක. මෙයට වඩා ඉහල උෂ්ණත්වයේ ගබඩා කිරීමෙන් ඵලයේ ගුණත්වය සීඝ්‍රයෙන් පහත වැටේ.

**වෙලඳපොල**

ඩ්‍රැගන් ෆෘට් විදේශීය රටවල් රාශියක සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන හොඳ ඉල්ලුමක් ඇති පලතුරකි. දේශීය වෙළඳපොලේ මෙය ජනප්‍රිය නොවුවද, කීල්ස් වැනි සුපිරි වෙළඳ සැල්වල මෙම පලතුරු කිලෝ එකක් රු. 250 - 300 අතර මුදලකට අලෙවි වේ.

අප රටේ දැනට සීමිත ලෙස වගා කරන මෙම බෝගය ව්‍යාප්ත කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේද අවධානය යොමුවී ඇත. දැනට පවතින ඉල්ලුමට සරිලන පැල ප්‍රමාණවත් නොවන නිසා පැල නිෂ්පාදනයට වැඩසටහනක්ද ක්‍රියාත්මක වේ.